# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 ජූලි මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

(2019.07.12 දින නිකුත් කරන ලදී)

## සුරාබදු (සංශෝධන)

**(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 35 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ වරෙන්තුවක් නොමැතිව වරදකරුවන් අත්අඩංගුවට ගත හැකි විධිවිධාන පුළුල් කිරීම යි.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ වැරදි පිළිබඳව ක්‍රියා කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත ඇති බලය පුළුල් කිරීම සඳහා තවත් වැරදි ඇතුළත් කිරීම මඟින් වගන්තියේ විෂයය පථය පුළුල් කිරීම වේ.

# සුරාබදු (සංශෝධන)

එල්.ඩී.—ඕ. 46/2018

## (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ පනත 2019 අංක     දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 35 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "46 වන වගන්තිය හෝ 47 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "46 වන වගන්තිය, 47 වන වගන්තිය හෝ 48 වන වගන්තියේ (අ) ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) 46 වන වගන්තිය, 47 වන වගන්තිය හෝ 48 වන වගන්තියේ (අ) ඡේදය යටතේ නම්, ඔහුගේ ම දැනීම හෝ සැකය මත හෝ සුරාබදු නිලධරයකුගේ හෝ පොලිස් නිලධරයකුගේ පැමිණිලි කිරීමක් හෝ වාර්තාවක් මත හැර:

එසේ වුව ද, පොලිස් නිලධරයකු විසින් 48 වන වගන්තියේ (අ) ඡේදය යටතේ පැමිණිල්ලක් කරනු ලබන අවස්ථාවක දී හෝ වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, එම නිලධරයා උප පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු විය යුතු අතර, ඔහු විසින් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන වෙනත් යම් නිලධරයකුගේ ලිඛිත එකඟත්වය ලබාගත යුතු ය.";

(2) එහි (ආ) ඡේදයෙහි -

(අ) “48 වන වගන්තිය” යන වචන සහ ඉලක්කම වෙනුවට “48 වන වගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය” යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්; සහ

(ආ) “වාර්තාවක් මත හැර,” යන වචන වෙනුවට “වාර්තාවක් මත හැර; හෝ” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

“(ඇ) 50 වන වගන්තිය යටතේ නම්, ඔහුගේ ම දැනීම හෝ සැකය මත හෝ සුරාබදු නිලධරයකුගේ පැමිණිලි කිරීමක් හෝ වාර්තාවක් මත හැර,”.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.